2020 වසර තුළ දිවි තොර කරගැනීම් 3,074 ක් පමණ ශ්‍රී ලංකාව තුළ සිදුවූ බව පොලිස් වාර්තාවන්ගෙන් පැවසේ. එය දිනකට දිවි තොර කරගැනීම් 8.4 ක සාමාන්‍යයකි. හදිසි උපකාරක අංක ඔස්සේ හෝ අවශ්‍ය උපදේශන සහාය ලැබුණේ නම් බේරාගත හැකිව තිබූ ජීවිත කෙතරම් ප්‍රමාණයක් මෙම දිවි තොර කරගැනීම් 3,074 තුළ තිබෙන්නට ඇතැයි ඔබ සිතන්නේද?

දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් හා හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු එම හදිසි උපකාරක අංක ඔස්සේ උපදේශන සේවාවන් හා සම්බන්ධ වීමටත්, එයින් එවැනි අයෙකුගේ ජීවිතය බේරාගැනීමට අවකාශයක් ලැබීමටත් අවකාශය පවතින බව, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් පවසයි.

දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකින් යුතු අයෙකුගේ ජීවිතය බේරා ගැනීමට අවස්ථාවක් ලැබිය හැකි බව Ethics Eye අපි විසින් දිගින් දිගටම අවධාරණයෙන් සඳහන් කොට තිබේ. ඒ අනුව, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසයන් තුළ මාධ්‍ය වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමට උත්සුක වූ පුවත්පත් සහ රූපවාහිනී නාලිකා පහත පරිදි හඳුනාගත හැකියි. එය සැබවින්ම ප්‍රශංසනීය බවත්, එය ශ්‍රී ලංකා මාධ්‍ය තුළ ධනාත්මක වර්ධනයක් ලෙසින් හඳුනා ගත හැකි බවත් අපි මෙසේම පවසමු.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

මූලාශ්‍ර:

https://www.police.lk/.../04.Mode-of-suicides---for-Year...
https://apps.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf...